නාඩි ජ්‍යෙතිෂ්‍ය අනාවැකියක් ඇසුවෙමි

ශ්‍රීලාල් සෙනෙවිරත්න

ඉන්දියාවේ සිට පැමිණි සිටින ''සාමිවරු'' පිරිසක් නාඩි ජ්‍යෝතිෂයෙන් ඉතාම නිවැරදි අනාවැකි කියන ස්ථානයක් වැල්ලවත්තේ ඇති බව මම අසා තිබුණේ වසර කිපයකට කලිනි. වසර දහස් ගනනකට පෙර ඍෂිවරයන් විසින් ලියන ලද පුස්කොළ සටහන්වල සෑම පුද්ගලයකුගේම දෙවය ලියා ඇති බවත්, ''සාමිවරු'' විශ්මිත අනාවැකි පවසන්නේ එම පුස්කොළ පොත් භාවිතයෙන් බවත්, එම ස්ථානයට අනාවැකි අසන්නට පැමිණෙන වැඩි පිරිස දේශපාලකයන්ද ඇතුළුව සමාජයේ ඉහළ තලයක සිටින්නන් (උගත්, බුද්ධිමත්, ධනවත්) බවත් එහිදී මා අසා තිබුණි. එවක් පටන් මේ කියන ස්ථානයට ගොස් නාඩි ජ්‍යෝතිෂයෙන් විශ්මිත අනාවැකියක් අසාගැනීමේ ආශාවක් ඔසිතේද විය. පර්යේෂණාත්මක අරමුණක් ද සහිතව පසුගිය දිනෙක එය ක්‍රියාත්මක කරන ලද අවස්ථාවේදී මා ලද අත්දැකීමයි මේ.

වැල්ලවත්තේ බවට ප්‍රසිද්ධ වුවද මේ කියන ස්ථානය පිහිටා ඇත්තේ වැල්ලවත්ත මායිම ආසන්නයට වන්නට බම්බලපිටියේ ය. 2013-10-21 වන සවුදා දින මම එම ස්ථානයට යන විට උදේ අටහමාරට පමණ විය. ඒ වන විටත් අනාවැකි අසන්නට පැමිණි සැළකිය යුතු පිරිසක් එහි රැඳී සිටිනු දැකගත හැකි විය. එහි සම්බන්ධීකාරකයකුගෙන් තොරතුරු විමසා සිටි විට ඔහු මා වෙත මුද්‍රිත පත්‍රිකාවක් ලබාදුන්නේය. පරිච්ඡේද 1 සිට 12 දක්වා අංක පිළිවෙළට අනාවැකියෙන් කියැවෙන කරුණු ගැන විස්තරයක් පහලින් දක්වා තිබිණ. වෙන්ව සොයා ඇති පරිච්ඡේද යනුවෙන් තවත අංක 4ක් ද අවසානයේ විය. උදාහරණ මෙසේය.

4 වන පරිච්ඡේදය - මව නිවාස ඉඩම් වාහන සම්බන්ධ තොරතුරු
8 වන පරිච්ඡේදය - ආයු කාලය, අයහපත් කාල සීමාවන්, හදිසි අනතුරු ආදිය

සෙසු පරිච්ඡේද බැලීමට ප්‍රථම 1 වන පරිච්ඡේදය බැලීම අවශ්‍යයෙන්ම කළ යුතු බව සඳහන්ව තිබිණ. එක් පරිච්ඡේදයක් බැලීම සඳහා අයකරන ගාස්තුව රුපියල් 1000/-ක් බව සම්බන්ධීකාරකයා පැවසුවේ ය. ඒ අනුව යම් අයෙක් තමන්ගේ ජීවිතයට අදාළ තොරතුරු සියල්ල බලාගන්නේ නම් වෙන්නට සිදුවන මුදල රුපියල් 12,000/-කි. වෙන්ව සොයා ඇති පරිච්ඡේද හතරත් බැලුවහොත් රුපියල් 16,000/- කි. විශේෂිත කාරණයක් පමණක් (විවාහය/අධ්‍යාපනය/විදේශ ගමන් ආදී වශයෙන්) බලාගන්නේ නම් අනිවාර්යෙන්ම බැලිය යුතු බවට නියම කර ඇති 1 පරිච්ඡේදයේ ගාස්තුවත් සමග ගෙවන්නට සිදුවන (අවම) මුදල රුපියල් 2000/-කි.

මා වැඩේට කැමතිවීමෙන් පසු සම්බන්ධීකාරකයෙක් පැමිණ මගේ උපන්දිනය විමසා කොල කැබැල්ලක සටහන් කරගන්නා ලදි. අනතුරුව එම කොල කැබැල්ලට මගේ දකුණු අතේ මහපටගිලි සටහනද ලබාගෙන දහවල් 12.30ට නැවත පැමිණෙන ලෙස දැනුම්දුන්නේය.

ඒ අනුව දහවල් නැවත එහි ගිය පසු සම්බන්ධීකාරකයකු විසින් මා කාමරයකට කැඳවනු ලැබීය. මේසයක් සහ පුටු කිපයක් තිබූ එහි එක් බිත්තියක විවිධ දේවතා රූප කිපයක්ද රඳවා තිබෙනු දක්නට ලැබිණ. සුළු වේලාවකට පසු තරුණ විය නොඉක්මවූ පෙනුමක් ඇති ''සාමිවරයෙක්'' පුස්කොළ පොතක් අතැතිව එහි පැමිණියේය. දේව රූපවලට ආසන්නයේ අසුන් ගෙන පසුකොළ පොතේ පිටු එකිනෙක පෙරළමින් ඔහු කිසියම් භාෂාවකින් මොනවාදෝ කීම ආරම්භ කළ අතර ඔහු සමග පැමිණි ලාබාල පෙනුමක් ඇති තරුණයෙක් එහි සිංහල අර්ථය ප්‍රකාශ කරන ලදි. මෙහිදී පසය භාගයකට ආසන්න කාලයක් පුරා ''සාමි'' පුස්කොළ පොත පෙරළමින් මගේ පොද්ගලික තොරතුරු පවසන්නටද, වරදින තොරතුරු මගෙන්ම විමසන්නටද විය. මා පිළිබඳ දීර්ඝ වශයෙන් විවිධ කරුණු ඉදිරිපත් කරමින් ඔහු පවසන ලද දේ අතරින් නිවැරදි වූයේ මගේ මවගේ සහ පියාගේ නම් පමණක් වූයෙන් මම විමතියට පත්වුණෙමි. අනෙක් සියළු කරුණු මුළුමනින්ම වැරදි විය.

මගේ පියාගේ නම ''සාමි'' නිවැරදිව පැවසුවද එයද පුස්කොළ පිටු බලා එකවර පළකළ අනාවැකියක් නොවීය. මුලින්ම පියාගේ නමේ මුල් අක්ෂරය ''සාමි'' ප්‍රකාශ කළේය. එය ''වැරදි'' බව මම පැවසුවෙමි. එවිට තවත් අක්ෂර තුනක් පමණ ප්‍රකාශ කර පියාගේ නම ඇරඹෙන්නේ ඉන් එකකින්දැයි මගෙන් විමසීය. ඒවාද වැරදි බව මම පැවසුවෙමි. ඊළඟ අවස්ථාවේ තවත් අක්ෂර පහක් හයක් පවසමින් ඉන් එකකින්දැයි නැවත විමසා සිටියේය. ඒ අක්ෂරද නිවැරදි නොවීය. සිව්වැනි අවස්ථාවේ ඔහු යෝජනා කළ අක්ෂරය නිවැරදි විය. (ඒ වන විට අක්ෂර දහයක් පොළහක් ප්‍රතික්ෂේප වී තිබිණ.) අනතුරුව පියාගේ නමට ඇති අක්ෂර ගණන හතරක් බව ''සාමි'' පැවසුවේය. එය ''වැරදි'' බව මම පැවසුවෙමි. එවිට අක්ෂර තුනක් බව ඔහු පැවසුවේය. එයද නිවැරදි නොවීය. ඊළඟට ඔහු විමසා සිටියේ පියාගේ නමට අක්ෂර පහකට වඩා තිබේද යන්නය. මම ''ඔව්'' යැයි කීවෙමි. ''සාමි'' පියාගේ නම නිවැරදිව පවසන ලද්දේ මේ ප්‍රශ්ණ විචාරා අවසානයේදීය. මවගේ නම නිවැරදිව කීවේද මේ ආකාරයෙනි. පියාගේ නම එකවරම නිවැරදිව කීවද මවගේ නම කීවේ එලෙස නොවේ. අසන්න නම් දෙක තුනක් පවසා ඉන් එකක්දැයි විමසා සිටියේය. ඉන් එකක් මවගේ නම විය.

''සාමි'' විවිධ අක්ෂර යෝජනා කරමින් මගේ නම කීමට ගත් සියළු ප්‍රයත්නයන් අසාර්ථක විය. වාසගම අතහැර මුලින්ම යෙදෙන නම සම්බන්ධයෙන් අනාවැකිය පවසන බව කියමින් ඔහු ඉදිරිපත් කළ නම් සියල්ල වැරදි ගියේය. අවසානයේ නම් තුනක් ඉදිරිපත් කරමින් ඉන් එකක් හෝ එසේ නොමැතිනම් එවැනි නමක්දැයි මගෙන් විමසා සිටියේය. එලෙස ඉදිරිපත් කළ නම් තුනෙන් එකක ඉස්පිලි පාපිලි වෙනස්කම් කිරීමෙන් මගේ නම සාදාගත හැකි බැවින් මම එවැනි නමක් බව පැවසුවේය. එවිට තවත් නම් කිපයක්ම ඉදිරිපත් කළද ටිකක් අමුතු නමක් වන මගේ මුල් නම නිවැරදිව කීමට කිසිසේත් ඔහුට නොහැකි විය. අවසානයේ පුස්කොළ පොත පැත්තකින් තබා එය මගෙන්ම විමසා දැනගන්නට ඔහුට සිදුවිය. පුසකොළ ඒ මේ අත පෙරළ පෙරළා මගේ බිරියගේ නම කියන්නට උත්සාහ දරමින් ''සාමි'' කළ ප්‍රශ්ණ විචාරමේදී ඇයගේ නම අතුරු තුනක එකක්දැයි ඔහු විමසා සිටි විටෙක මම හිස වනා ''ඔව්'' කියා තිබුණි. ඇගේ නමේ මුල් අක්ෂරයද අවසන් අක්ෂරයද මගෙන්ම විමසා තහවුරු කරගැනීමෙන් පසු අතුරු තුනේ නම් වැලක්ම ''සාමි'' ඉදිරිපත් කළේය. ඒ සියල්ල වැරදි බව මම කියා සිටි විට එසේ නම් බිරියගේ නම කුමක්දැයි ඔහු මගෙන්ම විමසා සිටියේය. මම නම කීවෙමි. ''අතුරු තුනක්යැ ඒකට පහක් තියනවානේ'' යි ඔහු නොරිස්සුම් සහගතව පැවසුවේය.

මගේ සහෝදර සහෝදරියන් ගැන කීමේදී මුලින්ම පැවසුවේ සහෝදරියන් සිටින බවය. එය නිවැරදි බව මම කී පසු ඔහු ඉදිරිපත් කළ සංඛ්‍යාව දෙකකි. එයද වැරදි විය. මේ ආකාරයෙන් පවුලේ සාමාජිකයන් ගැන කිසිවක්ම එකවර නිවැරදිව කියන්නට ''සාමි'' අපොහොසත් විය. පසය භාගයක් පමණ මෙලෙස පැවැති වෙහෙසකාරී ප්‍රශ්ණ විචාරාත්මක වැඩසටහන අවසානයේ මගේ කටෙන්ම මගේ පවුල් පසුබිම පිළිබඳ විස්තරයක් ප්‍රකාශ කරවාගත් ''සාමි'' මගේ උපන් වේලාව විමසා, එයද සටහන් කරගෙන කාමරයෙන් පිටව ගියේය.

පසය භාගයකට පමණ පසු දෙවැනි වටය ආරම්භ කරන්නට වයස්ගත භාෂා පරිවර්තකයකු සමග ''සාමි'' නැවත පැමිණියේ තවත් පුස්කොළ පොතක්ද රැගෙනය. බලන්නේ කුමන චැප්ටරයන්දැයි මගෙන් විමසා සිටියේය. මම හතරවෙනි චැප්ටරය බව කීවෙමි. එය පමණක්දැයි මගෙන් නැවත විමසා සිටියේ උකටලී ස්වාභාවයෙනි. මම ''ඔව්'' යැයි කීවෙමි. එසේ වුවද සියල්ලට පෙර පළමු චැප්ටරය බැලීම අවශ්‍යම බව කියමින් වැඩේ පටන්ගත්තේය.

පටිගත කිරීමේ යන්ත්‍රයක් ක්‍රියාත්මක කිරීමෙන් පසු නොතේරෙන භාෂාවෙන් ස්තෝත්තයක් වැනි යමක් කියමින් මගේ පොද්ගලික තොරතුරු කියන්නට පටන්ගත්තේය. එලෙස කියන දේ සිංහලට පරිවර්තනය කළේ පරිවර්තකයා විසිනි. එහිදී පුස්තොළ පොත දෙස බලාගෙන දැහැගකට සමවැදී මෙන් පවසන ලද මගේ පවුල් පසුබිමට අදාළ විස්තර සියල්ල ඊට සුළු වේලාවකට පෙර මගෙන්ම විමසා තහවුරු කරගෙන ගිය දේවල් විය. නමුත් කීවේ පුස්කොළ පොතේ ඇති දෙයක් කියන ආකාරයෙන් සහ දේවබලයෙන් සාස්තරයක් කියන ආකාරයෙන් විය. පරිවර්තකයාද ''-ඇටිටි හැලෙන්න'' පරිවර්තනය කළේය. මෙලෙස 1 පරිච්ඡේදයේ දැක්වෙන ''පෙළපත පරපුර සම්බන්ධ කරුණු'' නාඩි ජ්‍යෙතිෂ්‍යයෙන් ''ටක්කෙටම නිවැරදිව'' කියාදීමෙන් පසු ''සාමි'' ජයග්‍රාහී සිනාවක් පෑවේය.

අනතුරුව ඔහු මගේ කේන්ද්‍රය පිළිබඳ විස්තර පවසන්නට විය. මුලින්ම මගේ ලග්නය ''මිථුන'' බව හෙතෙම පැවසුවේය. මම එය ''වැරදි'' බව කීවෙමි. එසේ නම් ලග්නය කුමක්දැයි ඔහු විමසා සිටියේය. මම මගේ ලග්නය කීවෙමි. අනතුරුව ඔහු පුස්කොළ පොත දෙස බලාගෙන කේන්ද්‍රයේ ග්‍රහ පිහිටීම් කියන්නට පටන්ගත්තේය. එහිදී නවග්‍රහයන්ගෙන් එක් ග්‍රහකුගේ පිහිටීම නිවැරදිව කියන්නට ඔහු අසමත් විය. අනෙකුත් ග්‍රහ පිහිටීම් නිවැරදිව කීවේය. අවසානයේ පරිවර්තකයා කියා සිටියේ එක් ග්‍රහයෙක් පොඩ්ඩක් එහාට මෙහාට වුණාට ගැටළුවක් නොමැති බවය. (යම් තරමක ජෝතිර්විද්‍යා දැනුමක් ඇති අයෙකුට උපන් දිනය සහ වේලාව අනුව මනෝමයෙන් ලග්න රාශිය ගණනය කර ගත හැකිය. ලග්න රාශිය සොයාගන් විට එදින ග්‍රහ පිහිටීම් අනුව රාශි දොළහේ ග්‍රහයන් පිහිටන ආකාරයද බොහෝ දුරට නිවැරදිව කිව හැකිය.)

මෙලෙස ''නාඩි ජ්‍යෙතිෂ්‍යයෙන්'' කේන්ද්‍රයේ ග්‍රහයන් පිහිටවීමෙන් අනතුරුව ඒ අනුව මට ඉදිරියේදී ඇතිවන පළාපල කීම ඇරඹුවේය. එහිදී පැවසුව කරුණු සියල්ලම ''අභිගුණ්ඩික කාන්තාවන්'' අතබලා කියන සාස්තරවලට දෙවැනි නොවීය. මගේ ජීවිතයට අදාළව එකම විශේෂිත කරුණක් හෝ නිවැරදිව කියන්නට ''සාමි''ට හැකියාවක් තිබුණේ නැත. මගේ රැකියාව ගැන කියන්නට ගිය තැනදීද ''සාමි'' මහත් අසීරුතාවයකට පත්විය. පුස්කොළ පොත පෙරළමින් රැකියාවක් කරන්නේදැයි ඔහු මගෙන් විමසා සිටියේය. මම නැතැයි කීමි. එවිට ව්‍යාපාරයක් කරන්නේදැයි විමසුවේය. ඊටද නැතැයි කීමි. රැකියාවක් කරන්නට බලාපොරොත්තුවෙන් සිටින බව එවිට ඔහු යෝජනා කළේය. එවැනි විශේෂ බලාපොරොත්තුවක් නොමැති බව මම කීවෙමි. විදේශගතවීමට කැමැත්තෙන් සිටින බව එවිට ඔහු කීවේය. කලකට පෙර එවැනි කැමැත්තක් තිබුණද දැන් ඒ කාලය ඉකුත්ව ඇති බව මම කීවෙමි. එවර ඔහු විමසුවේ ''දේශපාලනය කරන්නේද?'' යනුවෙනි. මම එයද ප්‍රතික්ෂේප කළෙමි. බඳු කුලී ආදායම් ලබන්නේදැයි එවර ''සාමි'' විමසුවේය. එයද මම ප්‍රතික්ෂේප කළෙමි. එවිට කොන්තරත් කරන්නේදැයි විමසුවේය. එක්තරා ආකාරයක කොන්තරත් නම් කරන බව මම කීවිට ඒ කවරාකාර කටයුතුදැයි ඔහු විමසුවේය.

මේ ආකාරයෙන් රැකියාව ගැන අනාවැකි කියන්නට ගොස් පත්වුණාට නොදෙවෙනි දුක්කරතාවයකට ''සාමි'' පත්වුණේ මගේ අධ්‍යාපනික තත්ත්වය ගැන කියන්නට ගොසිනි. මේ කරුණු දෙක සම්බන්ධයෙන් ආසන්න වශයෙන් හෝ නිවැරදි අනාවැකියක් කියන්නට ''සාමි'' අපොහොසත් විය.

අවසානයේ මගේ ඉල්ලීම වූ හතරවන චැප්ටරය කියන්නට ගිය තැන ''සාමි'' නිවැරදි කළ නොහැකි ආකාරයේ බලවත් වරදක් කර ගත්තේය. ඒ මගේ මව ගැන කීමේදීය. නිතරම ලැබෙන අම්මාගේ ආශිර්වාදය මත මගේ දියුණුව සැළසෙන බව ඔහු අවස්ථා කිපයකදීම ප්‍රකාශ කළේය. අම්මා සම්බන්ධයෙන් පුන පුනා ඔහු පවසන ලද දේවල් පොදුවේ මනුෂ්‍ය සමාජයේ බොහෝ දෙනෙකුට අදාළ වන කාරණා විය. දෛවෝපගත ලෙස එම කරුණු මට අදාළ වී තිබුණේ අම්මාගෙන් නොව තාත්තාගෙනි. එහෙත් හතරවන චැප්ටරය බලා පියා ගැන කිව නොහැකි නිසාදෝ ''සාමි'' දිගින් දිගටම අම්මා ගැන කියූ මේ දේවල් සියල්ල වැරදි බව මම අවසානයේ ඔහුට කීවෙමි. අම්මා කාලයක් තිස්සේ මා සමග අමනාපයෙන් පසුවන බවත් එසේ තිබියදී අම්මාගේ ආශිර්වාදයෙන් සියල්ල ලැබෙන බව කීම වැරදි බවත් මම කී විට ඔහු අපූරු උත්තරයක් දුන්නේය. අනාවැකියෙන් කියවුණේ දැනට පවතින තත්ත්වය නොව ඉදිරියේදී සිදුවන තත්ත්වයන් බව ඔහු කියා සිටියේය. අම්මා මියගිය පසු අයයගේ ආශිර්වාදය ලැබීමෙන් මගේ දියුණුව සැළසෙන බව යැයිද අනාගතයේ සිදුවීමට නියමිත දෙයක් එසේ නොවනු ඇතැයි කීමට මට හැකියාවක් නොමැති බවද ඔහු කියා සිටියේය. ජීවත්ව සිටින අම්මාගෙන් නොලැබෙන ආශිර්වාදයක් මියගිය විට ලැබේයැයි කීම කෙසේ නම් විශ්වාස කළ හැකිදැයි මම එවිට විමසා සිටියෙමි. මිය යන විට සිත වෙනස්විය හැකි බවත්, එවිට ආශිර්වාදය ලැබිය හැකි බවත්, මේ කියන්නේ අනාගතයේ සිදුවන දෙයක් ගැන බවත් එවිට පිළිතුර විය.

මේ නාඩි වාක්‍යය අසන්නට බොහෝ අය යති ඉදිරියේදී යන්නට සිතා සිටින අයට නැවතක ඒ ගැන සිතීම සඳහා මගේ අත්දැකීම මෙසේ ලිවීමේ විමසුවේය.

මේ නාඩි වාක්‍යය අසන්නට බොහෝ අය යති ඉදිරියේදී යන්නට සිතා සිටින අයට නැවතක ඒ ගැන සිතීම සඳහා මගේ අත්දැකීම මෙසේ ලිවීමේ

ස්මාරකයක් නැති විරුවා

උන් එසඳ
අලු දුනුවිලි කර නුඹ
විසුළ මේ බිම මත
පිබිදුනු රතු රෝස කුසුමක
මුදු පෙත්තක් මත
රැඳුණි පිණි කඳුලක් රහසින..

ස්මාරකයක් නැති විරුව,
නමා දෙදණ එමල ඉදිරියේ
පහත් කරගත් හිසින් යුතුවම
බලා සිටිනෙමි නිහඬව
විස්සෝපයෙන්
දැඳුරු වූ හඳින්..

පර නොවන මේ රතු කුසුම මත
සැඟවුණ නුඹෙ බරැති හඳවත
සිප ගනිමි ලොවට රහසින
ආත්මාර්ථය පරදු
මිනිසා නුඹ වූ බැවින....

විදුර ප්‍රභාත් කන්නන්ගර

සුභාෂිතයෙන් ...

මෙලොවින් පරලොවින් වන අවැඩ නොම	දැන
සිරිතින් ලොව පැවති නැත බල මඳ	දුදන
දෙකුලෙන් යුතුව උපනත් සක කිරි	ලෙසින
කුසුමෙන් උපන් පනු වැනි පෙර කල	පවින

ගැදි කවිය :
මෙලොවින (සහ) පරලොවින් - වන අවැස් නොදැන - ලොව පැවැති සිරිතින් - නැත බල මඳ දුදන - සක කිරි ලෙසින - දෙකුලෙන් යුතුව උපනත් - පෙර කල පවින - කුසුමෙන් උපන් පනු වැනි.

තේරුම : මේ ලෝකයෙනුත් පරලෝකයෙනුත් සිදු වන විපාක නොදැනීම නිසා, ලෝකයෙහි පවතින සිරිත නිසා මෝඩ මිනිසුන් උබයකුල පරිශුද්ධව උපන්නත් පෙර කල පව් නිසා මල් වල හැඳෙන පනුවන් වැනිය.

ගෘහනියක (මවක) හා පිරිමියකු (පියකු) අඹු සැමියන් ලෙස ජීවත් වීමේ ලෝක වාරිත්‍රය (ලෝ දහම) නිසා දරුවෝ උපදිත්, මා පියන් කුලවතුන් නිසා උබය කුල පරිශුද්ද වේ.

මේ කවියේ දෙවන පදය සමහර පොත්වල වෙනස් විදියට දැක්වේ. උගතුන් තම උගත්කම අනුව මුල් පිටපත සුද්ද කිරීමේ ප්‍රතිපලයක් විය හැකිය. එවිට අදහස මඳක් වෙනස් වේ.

"සිරිතින් ලොව නොපවතින අඳ බල දුදන"

සක කිරි ලෙසින - දෙකුලෙන් යුතුව උපනත් - පෙර කල පවින - මෙලොවින් පරලොවින් - වන අවැඩ නොම දැන- ලොව සිරිතින් නොපවතින, අඳ බල දුදන - කුසුමෙන් උපන් පනු වැනි.

හක් ගෙඩියක දමා පු කිරිමෙන් (මව්පිය) උබය කුල පිරිසිදුව උපන් මු පෙර කල පවින් මෙලෝ පරලෝ දෙකින් වන විපාක ගැන නොසිතා ජීවත් වන අන්ද බාල දුදනා මලක හැඳුනු පනුවකු වැනිය.

මේ කියන අන්ද බාල දුදනා උබය කුල පිරිසිදුය. පෙර කල පව නිසා ඔහු ලෝ සිරිතට අනුව ජීවත් නොවේ. ඔහු මලක හැඳුනු පනුවකු වැනිය. කතුවරයා කියන්නට සිතූ අදහස මෙ යයි සිතමි. මා මේ පොතේ මුල් පිටපත දැක නැත.

වි. ක. ධර්මබන්ධු